# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2319/22 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.-21/78(xv)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්,

*(අ)* ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, කලින් කල සංශෝධිත 2006 ජූනි මස 09 වන දින අංක 1448/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන (2017 ජනවාරි මස 18 වැනි දින අංක 2002/32 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) "හෙද පීඨය" යන අයිතමයට සහ ඒ උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ :-

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය (1979 දෙසැම්බර් මස 21 වැනි දින අංක 67/14 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියෙහි නිශ්චිතව දක්වා ඇති මින් පෙර දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන) | 1. කාය චිකිත්සා සහ දේශීය චිකිත්සා අධ්‍යයනාංශය (ආයුර්වේද වෛද්‍ය විද්‍යා සහ දේශීය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය)<br>2. මෞලිජාත් අධ්‍යයනාංශය (යුනානි සායනික වෛද්‍ය විද්‍යා අංශය)<br>3. ඉල්මුල් අද්වියා අධ්‍යයනාංශය (යුනානි ඖෂධවේද අධ්‍යයනාංශය)<br>4. ශල්‍ය ශාලක්‍ය සහ ප්‍රසූතිතන්ත්‍ර කෞමාරාභෘත්‍ය අධ්‍යයනාංශය (ආයුර්වේද ශල්‍ය කර්ම, ඊඑන්ටී, ඔප්තැල්මොලොජි සහ නාරිවේදය, ප්‍රසව විද්‍යාව සහ බාල චිකිත්සා අධ්‍යයනාංශය)<br>5. ද්‍රව්‍ය ගුණ, විඥාන සහ ස්වස්ථවෘත්ත අධ්‍යයනාංශය (ආයුර්වේද ඖෂධවේද, ඖෂධ සහ ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය)<br>6. මෞලික සිද්ධාන්ත සහ ශරීර විඥාන අධ්‍යයනාංශය (මූලික මූලධර්ම, ආයුර්වේද ව්‍යුහවිද්‍යාව සහ කායික විද්‍යා අධ්‍යයනාංශය) |

*(ආ)* මෙම නියමය 2023 මාර්තු මස 01 වැනි දින සිට බලාත්මක වන බවට ප්‍රකාශ කරනු ලැබේ.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0140


1A - PG 6218 — 457 (2023/02)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම *අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.